## හානි වූ තොග ගිණුම

විකිණීම සඳහා යම් ව්‍යාපාරයක් ලබාගත් භාණ්ඩ යම් ව්‍යවසනයක් මත හානි වී තිබීම මෙය වේ.

තොග හානි ගිණුම ~~හර~~ → මුලය හා වෙනත් වියදම් වල

ගැනුම් ගිණුම ~~බැර~~ → ගැනුම් වලින් අඩු කරයි.

ණ තොග හානිය වෙනුවෙන් රක්ෂණ වන්දියක් ලැබේ නම් එවිට සටහන් කිරීමේ ද්විත්ව සටහන.

ලැබිය යුතු රක්ෂණ වන්දි ගිණුම හර

ලාභාලාභ ගිණුම / තොග හානි ගිණුම හර

ගැනුම් ගිණුම බැර

උදා : සිදු වූ ගින්නක් මත රු. 100,000ක තොගයක් හානි විය.

සිදු වූ ගින්නක් මත රු. 100,000ක තොගයක් හානි විය. නමුත් එයින් 75% ක් රක්ෂණ සමාගමෙන් ගෙවීමට එකඟ වී ඇත.

## විකිනීමේ හෝ ආපසු එවීමේ පදනම මත භාණ්ඩ යැවීම.

ව්‍යාපාරයක් යම් තැනැත්තෙකුට හෝ ආයතනයකට විකිණීම හෝ විකුණු කලපරිච්ඡේදය අවසාන වීමට පෙර විකිණී නැති තොග ආපසු එවීමේ පදනම මත භාණ්ඩ විකුණනු ලබයි. මෙහිදී එම භාණ්ඩ නියෝජිතයා විකිණීමෙන් පසු අප ව්‍යාපාරය මෙසේ ගැලපිය යුතුය.

අදාල ණයගැති ගිණුම හර

විකුණුම් ගිණුම බැර

එමෙන්ම එසේ භාණ්ඩ විකුණු පසු ව්‍යාපාරයේ අවසන් තොගයෙන් එම භාණ්ඩ පිරිවැය අඩු කල යුතුය.

නමුත් භාණ්ඩ නියෝජිතයා විකිණීමට පෙර ව්‍යාපාරය විකිණීම සඳහා භාණ්ඩ යැවීමේදී ව්‍යාපාරයක් වැරදීමෙන් විකුණුම් ලෙස වාර්තා කර ඇත්නම් යුතු දිනය එළඹීමට ප්‍රථම නොවිකුණු තොග ආපසු එවූ විට මෙසේ ගැලපිය යුතුය.

විකුණුම් ගිණුම හර (ඉන්වොයිස් වටිනාකම)

ණයගැති ගිණුම බැර (ඉන්වොයිස් වටිනාකම)

එමෙන්ම භාණ්ඩ නියෝජිතයා විකිණීමට පෙර ව්‍යාපාරය විකිණීම සඳහා භාණ්ඩ යැවීමේදී ව්‍යාපාරයක් වැරදීමෙන් එම භාණ්ඩ අවසාන තොගයෙන් ඉවත් කර ඇත්නම් එම අවසාන දිනය වන විට නැවත එවූ භාණ්ඩ ව්‍යාපාරයේ අවසන් තොගයට පහත ආකාරයෙන් ගැලපිය යුතුය.

අවසන් තොග ගිණුම හර (පිරිවැය)

වෙළඳ ගිණුම බැර (පිරිවැය)

<u>එනම් මෙම ගැලපිල්ල මත</u>

විකුණුම් ↓ - අදායම් ප්‍රකාශයේ

ණයගැති ↓ - ශේෂ පත්‍රයේ

අවසන් තොගය ↑ → - වෙළඳ ගිණුමේ

→ - ජංගම වත්කම් වල අවසාන තොගයේ

උදා : විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත 25%ක ලාභයක් තබා රු. 200,000ක පිරිවැය වූ භාණ්ඩ විකුණා ඇත. එම භාණ්ඩ වලින් රු. 30,000ක භාණ්ඩ විකුණා නොමැති විට නැවත ආපසු එවන ලදී. මේ සම්බන්ධ කිසිම සටහනක් නොමැත.

උදා : විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත 10%ක් ළඟ තබා රු. 220,000 ඉන්වොයිස් මිලක් සහිත ව විකුණා ඇති අතර එයින් 1/4 ක භාණ්ඩ ප්‍රමාණයක් විකුණා ඇත. ඉතිරිය ආපසු ඒවා ඇත.

❖ සඳරුවන් වික්‍රමසිංහගේ ව්‍යාපාරයේ පොත් වලින් 2016.03.31 දිනට උපුටා ගන්නා ලද ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර රු. | බැර රු. |
|---|---|---|

| | | |
|---|---|---|
| විකුණුම් | | 178,150 |
| ණය හිමියෝ | | 38,000 |
| ගැනුම් | 56,000 | |
| විවිධ අදායම් | | 3,300 |
| බැංකු ණය | | 20,000 |
| ලැබූ කඩ කුලී | | 3,400 |
| සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි (පිරිවැයට) | 245,000 | |
| යන්ත්‍රෝපකරණ (පිරිවැයට) | 125,000 | |
| මෝටර් වාහන (පිරිවැයට) | 175,000 | |
| ලද වට්ටම් | | 3,200 |
| ප්‍රචාරණය | 9,800 | |
| ආපසු එවුම් | 800 | |
| ආපසු යැවුම් | | 1,600 |
| විකුණුම් අංශයේ වැටුප් | 4,500 | |
| ගෙන ඒමේ කුලී | 4,300 | |
| ගෙන යාමේ කුලී | 2,500 | |
| ණය ගැතියෝ | 7,800 | |
| විදුලිය | 2,000 | |
| රක්ෂණය | 8,800 | |
| බොල්ණය | 700 | |
| අඩමාන ණය වෙන්කිරීම 2015.04.01 | | 1,300 |
| කාර්යාල වියදම් | 9,150 | |
| වේතන හා වැටුප් | 16,800 | |
| විකුණුම් වියදම් | 3,100 | |
| ගැනිලි | 800 | |
| ක්ෂය වෙන්කිරීම 2015.04.01 | | |
| සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි | | 5,000 |
| යන්ත්‍රෝපකරණ | | 12,500 |
| මෝටර් වාහන | | 25,000 |
| වරිපනම් | 3,800 | |
| බැංකු ශේෂය | 4,200 | |
| මුදල් ශේෂය | 600 | |
| බඩු තොගය 2015.04.01 | 10,800 | |
| ප්‍රාග්ධනය | | 400,000 |
| | 691,450 | 691,450 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

01. 2016.03.31 දිනට බඩු තොගය රු. 20,000 ක් ලෙස තක්සේරු කර ඇත.

02. ණය ගැතියෙකුගෙන් ලැබිය යුතු ණය මුදල වූ රු. 600ක් අයකර ගත නොහැකි බව පෙනී ගිය හෙයින් බොල්ණය ලෙස කපා හැරීමට තීරණය කර ඇත. අඩමාන ණය වෙන්කිරීම ණය ගැතියන්ගෙන් 10% ක් ලෙස පවත්වාගෙන යාම ව්‍යාපාරයේ ප්‍රතිපත්තියයි.

03. 2016.03.31 දිනට වරිපනම් සඳහා රු. 1200 ක් ද විදුලිය සඳහා රු. 200 ක් ද ගෙවිය යුතුව ඇත.

04. බැංකු ණය ලබාගෙන ඇත්තේ 2015.12.31 දින වන අතර ඒ සඳහා අදාල වාර්ෂික පොලී අනුපාතිකය 12% ක් වේ.

05. ස්ථාවර වත්කම් ක්ෂය කරනුයේ පහත සඳහන් ආකාරයටයි.

සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි සරල මාර්ග ක්‍රමය මත වාර්ෂිකව 5%

යන්ත්‍රෝපකරණ සරල මාර්ග ක්‍රමය මත වාර්ෂිකව 10%

මෝටර් වාහන හීනවන ක්ෂය ක්‍රමය මත වාර්ෂිකව 20%

06. විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත 20% ක ලාභයක් තබාගෙන ණයගැතියන්ට යවා ඇති රු. 6000 ක භාණ්ඩ වලින් ආපසු එවීමේ කාලය ඉකුත් වී නොමැති තවම විකුණුම් තත්වයට පත් වී නොමැති බඩු වල ඉන්වොයිස් වටිනාකම රු. 4800 කි. එම විකිණීම හා ආපසු එවීම යන ගනුදෙනු පිලිබඳ ව කිසිදු සටහනක් මෙතෙක් අප ගිණුම් පොත්වල වාර්තා කර නොමැති වුවද අවසාන තොගයට එම ගනුදෙනු නිසි පරිදි ගලපා ඇත.

07. 2015.12.31 දින සිදු වූ ගින්නක් නිසා රු. 12,250 ක විකිණීමට ගෙනා බඩු තොග විනාශ විය. එම ගිනි හානිය ආවරණය කරගැනීම සඳහා රක්ෂණ සමාගමෙන් ලබා ගත හැකි අවරණය එම පාඩුවෙන් 70% ක් පමණි. ගිනි හානිය පිළිබඳව පොත්වල වාර්තා නොකරන ලද නමුත් එම වන්දි මුදල ලැබීම පමණක් විකුණුම් ගිණුමට ඇතුලත් කර ඇත.

ඉහත කරුණු ඇසුරින් ඔබ විසින්,

01. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම

02. 2016.03.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

**<u>කළමනාකරණ කොමිස් ගැලපීම</u>**

යම් ව්‍යාපාරයක් තම කළමනාකරුවන් අභිප්‍රේරණය කිරීමට ශුද්ධ ලාභය හෝ විකුණුම් මත ප්‍රතිශතාත්මකව ලබා දෙන්නා වූ කොමිස් මුදල අපි මෙසේ හදුන්වමු.

මෙය ක්‍රම 2කි.

01. විකුණුම් මත හෝ ශුද්ධ ලාභය මත යම් ප්‍රතිශතයක් කොමිස් ලෙස ගැලපීම.

02. ශුද්ධ ලාභය හෝ විකුණුම් වලින් කළමනාකරණ කොමිස් අඩු කල පසු ශුද්ධ ලාභයෙන් යම් ප්‍රතිශතයක් ගැලපීම.

$$\frac{\text{කොමිස් අඩු කිරීමට පෙර ශුද්ධ ලාභය}}{100 + \text{කොමිස් ප්‍රතිශතය}} X \text{ කොමිස් ප්‍රතිශතය}$$

**01 ක්‍රමය**

2015/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වර්ෂයේ ලාභය රු. 200,000 යි.

<u>අතිරේක තොරතුරු</u>

- ශුද්ධ ලාභය මත 10% ක කළමනාකරණ කොමිස් ගෙවිය යුතුව ඇත.

**02 ක්‍රමය**

| | | |
|---|---|---|
| ව්‍යාපාරයේ ශුද්ධ ලාභය<br>කළමනාකරණ කොමිස් | <br>5,000 | 400,000 |

<u>අතිරේක තොරතුරු</u>

- කොමිස් අඩු කල පසු ශුද්ධ ලාභයෙන් 10% ක කළමනාකරණ කොමිස් හිමිය.

## <u>සේවක අර්ථසාධක හා භාරකාර ගැලපීම</u>

<u>සේවක අර්ථසාධක අරමුදල් ගැලපීම</u>

මෙම අරමුදල් සඳහා රජය හෝ පළාත් පාලන ආයතන වල සේවකයන් හැර සියලුම සේවකයන් දායක විය යුතුය. එමෙන්ම ව්‍යාපාරයද යම් ප්‍රතිශතයකින් දායක විය යුතුය.
01. සේවකයාගේ දායක මුදල = දල වැටුපෙන් 8% ක් හෝ 10% ක්
02. සේව්‍යාගේ දායක මුදල = සේවකයාගේ දල වැටුපෙන් 12% ක් හෝ 10% ක්

<u>සේවකයාගේ සේවක අර්ථසාධක අරමුදල් ගැලපීම.</u>

සේවක දල වැටුපෙන් යම් ප්‍රතිශතයක් ගණනය කර එය සේවක දල වැටුපෙන් අඩු කර සේවක අර්ථසාධක අරමුදලට ගෙවයි. එබැවින් එය ව්‍යාපාරයේ වෙනම වියදමක් නොවන අතර සේවක වැටුප් හා වේතන ගිණුමේ එක් කොටසක් පමණි. අදාල

සේවකයාගේ වැටුපෙන් අඩු කරගත් ප්‍රමාණය සේවක අර්ථසාධක අරමුදලට ව්‍යාපාරය ගෙවිය යුතු වගකීමක් ලෙස සලකා පහත පරිදි ගැලපිය යුතු ය.

වැටුප් හා වේතන ගිණුම　　　　හර
　　ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල්　　　　බැර

<u>සේව්‍යාගේ අර්ථසාධක අරමුදල් දායකය ගැලපීම</u>

සේවක දල වැටුපෙන් යම් ප්‍රතිශතයක් ගණනය කර එය ව්‍යාපාරය සේවකයා වෙත ගෙවන වැටුපට අමතරව සේවකයාගේ සුභසාධනය සඳහා ව්‍යාපාරය කරන ගෙවීමකි. මෙය ව්‍යාපාරයේ වියදමකි.

සේවක අර්ථසාධක අරමුදල් වියදම් ගිණුම　　　　හර
　　ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුම　　　　බැර

මෙය සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු බැවින් ජංගම වගකීම් වලද පෙන්නුම් කරයි.

<u>සේවක භාරකාර අරමුදල් ගැලපීම</u>

සේවක දල වැටුපෙන් යම් ප්‍රතිශතයක් (3%) ගණනය කර ව්‍යාපාරයේ සේවකයා වෙත ගෙවන වැටුපට අමතරව සේවකයාගේ සුභසාධනය සඳහා ව්‍යාපාරය කරන ගෙවීමකි. මෙය ව්‍යාපාරයේ වියදමකි.

සේවක භාරකාර අරමුදල් ගිණුම　　　　හර
　　ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් ගිණුම　　　　බැර

මෙය සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු බැවින් ජංගම වගකීම් වලද පෙන්නුම් කරයි.

01. ලාභයෙන් වැටුප් හා වේතන වෙන්කිරීම
　　වැටුප් හා වේතන ගිණුම / ලාභාලාභ ගිණුම　　හර
　　　　වැටුප් හා වේතන පාලන ගිණුම　　　　බැර

02. සේවකයාගේ සේවක අරමුදල් දායක ගැලපීම
　　වැටුප් හා වේතන පාලන ගිණුම　　　　හර
　　　　ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුම　　　　බැර

03. ශුද්ධ වැටුප් ගෙවීම
　　වැටුප් හා වේතන පාලන ගිණුම　　　　හර
　　　　මුදල් / බැංකු ගිණුම　　　　බැර

04.සේව්‍යාගේ සේවක අර්ථසාධක අරමුදල් ගැලපීම.

සේවක අර්ථසාධක අරමුදල් වියදම් ගිණුම / ලාභාලාභ ගිණුම හර
ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුම බැර

05.සේව්‍යාගේ සේවක භාරකාර අරමුදල් ගැලපීම.

ලාභාලාභ ගිණුම / සේවක භාරකාර අරමුදල් වියදම් ගිණුම හර
ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් ගිණුම බැර

❖ පහතින් දැක්වෙන්නේ 2016.03.31 දිනට නදුන් ව්‍යාපාරයෙන් උපුටා ගත් ශේෂ පිරික්සුමයි.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| විකුණුම් | | 600,000 |
| 2015.04.01 දින නිමි තොගය | 9,000 | |
| විදුලිය | 19,000 | |
| මෝටර් වාහන ධාවන වියදම් | 14,000 | |
| වරිපනම් හා රක්ෂණය | 36,000 | |
| ප්‍රචාරණ පිරිවැය | 2,500 | |
| අඩමාන ණය වෙන්කිරීම | | 600 |
| සේවක වැටුප් ගිණුම - ශුද්ධ වැටුප | 9,000 | |
| ණය - 18% | | 45,000 |
| පරිපාලන වියදම් | 2,500 | |
| ගැනුම් | 35,000 | |
| ලැබිය යුතු වෙළඳ ණය | 25,000 | |
| ගෙවිය යුතු වෙළඳ ණය | | 35,000 |
| 2016.01.01 ලබාගත් 10% ස්ථාවර තැන්පතු | 20,000 | |
| බැංකු ගාස්තු | 500 | |
| පිරියත හා යන්ත්‍ර - පිරිවැය / සමුච්චිත ක්ෂය 2015.04.01 | 25,000 | 4,500 |
| මෝටර් වාහන - පිරිවැය / සමුච්චිත ක්ෂය 2015.04.01 | 63,000 | 12,600 |
| ඉඩම් හා ගොඩනැගිලි - පිරිවැය / සමුච්චිත ක්ෂය 2015.04.01 | 950,000 | 45,000 |
| ඇසුරුම් වියදම් | 2,500 | |
| අතැති හා බැංකුවේ ඇති මුදල් | 560,600 | 14,700 |
| වට්ටම් | 400 | 250 |
| 2015.04.01 දිනට ප්‍රාග්ධනය | | 1331,350 |
| | 2089,000 | 2089,000 |

පහත සඳහන් තොරතුරු ද සපයා ඇත.

01. 2016.03.31 දිනට බඩු තොගය රු.2500 කට තක්සේරු කර ඇත.

02. ණය මුදල ලබාගන්නා ලද්දේ 205.10.01 දින දීය. ණය පොලි උපචිතව ඇත.

03. බොල්ණය ලෙස 2%ක් ණය ගැතියන්ගෙන් සපීර වශයෙන් කපාහැරීමට කළමනාකරණය තීරණය කරන ලදී. අඩමාන ණය ඉතිරි ණය ගැතියන්ගෙන් 5%ක් වෙන්කිරීමටද කළමනාකරණය තීරණය කරන ලදී.

04. දුන් වට්ටම් සඳහා වෙන්කිරීම ණය ගැතියන්ගෙන් 2% කි.

05. ක්ෂය වෙන්කිරීම් මෙසේය.

| | |
|---|---|
| පිරියත හා යන්ත්‍ර | 5% |
| මෝටර් වාහන - හීන වන ක්ෂය ක්‍රමය | 10% |
| ඉඩම් හා ගොඩනැගිලි | 8% |

06. තම සේවකයන්ට සේවකයාගේ දල වැටුපෙන් 10%ක් සේවක අර්ථසාධක අරමුදලට ද අඩුකරගෙන ශුද්ධ වැටුප ගෙවයි. එමෙන්ම ව්‍යාපාරය සේවකයාගේ දල වැටුපෙන් 15% , 3% ක් පිලිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට ද භාරකාර අරමුදලට ද තම ලාභයෙන් ගෙවනු ලබයි. මෙය පිළිබඳව කිසිදු ගැලපීමක් මෙතෙක් පොත් වල කර නොමැත.

ඉහත කරුණු ඇසුරින් ඔබ විසින්,

01. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම

02. 2016.03.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

❖ දෙවින් ව්‍යාපාරයේ 2016.03.31 දිනට උපුටා ගත් ශේෂ පිරික්සුම පහතින් දැක්වේ.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | | 150 000 |
| ඉඩම් හා ගොඩනැගිලි | 186 000 | |
| විකුණුම් | | 900 000 |
| ණයගැති / නයහිමියෝ | 150 000 | 60 000 |
| ණය පොලි | 10 000 | |
| මෝටර් රථ | 16 000 | |
| ලී බඩු | 15 000 | |

| | | |
|---|---|---|
| <u>ක්ෂය වෙන්කිරීම</u> | | |
| මෝටර් රථ | | 4 000 |
| ලී බඩු | | 3 000 |
| ගැනුම් | 195 000 | |
| මුල් තොගය | 10 000 | |
| විගණන ගාස්තු | 6 000 | |
| ණය 15% | | 350 000 |
| ගැනිලි | 40 000 | |
| ආපසු යැවුම් / ආපසු එවුම් | 8 000 | 3 000 |
| වරිපනම් | 6 000 | |
| රක්ෂණය | 2 000 | |
| ශුද්ධ වැටුප | 46 000 | |
| මුදල් | 72 490 | |
| බැංකු | 70 700 | |
| අවිනිශ්චිත ගිණුම | 510 | |
| | 1470 000 | 1470000 |

1. අවසාන තොගය - රු. 50 000
2. ක්ෂය වෙන්කිරීම්,
   ලී බඩු 5% (වාර්ෂිකව)
   මෝටර් රථ 10% (වාර්ෂිකව) - හීන වන ක්ෂය ක්‍රමය
3. අඩමාන ණය 5% ක් ගැලපිය යුතු අතර බොල්ණය, අඩමාන ණය ගැලපීමට පෙර ණයගැතියන්ගෙන් 1% ක් ගැලපිය යුතු ය. දුන් වට්ටම් වෙන්කිරීම 3% කි.
4. 2016.03.31 දින සිදු වූ ගින්නක් නිසා රු. 5 000 ක විකිණීමට ගෙනා බඩු තොග විනාශ විය. එම ගිනි හානිය ආවරණය කර ගැනීම සඳහා රක්ෂණ සමාගමෙන් ලබා ගත හැකි ආවරණය එම පාඩුවෙන් 90% ක් පමණි. එම ලැබූ මුදල විකුණුම් ගිණුමට පිටපත් කර ඇත.
5. රු. 56 000 ක් ඉන්වොයිස් මිලකට විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත පිරිවැය මත 40% ලාභයක් තබාගෙන ණයගැතියන්ට ඉන්වොයිස් කර ඇති නමුත් ආපසු එවීමේ කාලය නොමැති තවම විකුණුම් තත්ත්වයට පත්වී නොමැති බඩු වල ඉන්වොයිස් වටිනාකම රු. 28 000 කි. මෙම විකිණීම හා ආපසු එවීම හා තොගය ගැලපීම යන කිසිදු සටහනක් මෙතෙක් අප පොත්වල වාර්තා කර නොමැත.
6. තම සේවකයන්ට සේවකයාගේ දල වැටුපෙන් 8%ක් සේවක අර්ථසාධක අරමුදලට ද අඩුකරගෙන ශුද්ධ වැටුප ගෙවයි. එමෙන්ම ව්‍යාපාරය සේවකයාගේ දල වැටුපෙන් 12%, 3% ක් පිලිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට ද සේවක භාරකාර අරමුදලට ද තම ලාභයෙන් ගෙවනු ලබයි. මෙම පිලිබඳ ව කිසිදු ගැලපීමක් පොත්වල මෙතෙක් කර නොමැත.

7. 2016/03/31 දිනට ශේෂ පිරික්සුම සමාන නොවීම හේතුවෙන් අවිනිශ්චිත ගිණුමේ හි හර පැත්තට රු. 510 ක් මාරු කරන ලදී. පසුව සොයාගත් වැරදි පහතින් දැක්වේ.
   - රු. 1000 ක අත්පිට විකුණුම් මුදල් පොතෙහි පමණක් සටහන් වීම.
   - අවංකට ගෙවන ලද රු. 500 ක් මුදල් පොතේ මෙන්ම අවංකගේ ගිණුම් ද බැර පැත්තේ සටහන් වීම.
   - කරුනිකට ගෙවන ලද රු. 560 ක මුදල ඇයගේ ගිණුමේ රු. 650 ක් ලෙස පිටපත් වී ඇත.
   - ගමන් වියදම් ගිණුමේ එකතුව වූ රු. 600 ශේෂ පිරික්සුමට ගෙන ගොස් නොමැත.

ඉහත සඳහන් කරුණු ඇසුරින් ඔබ විසින්,

1. අවිනිශ්චිත ගිණුම
2. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම
3. 2016.03.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

❖ අමිල ට්‍රේඩර්ස් හි පොත් තබන්නා විසින් එහි පොත්වලින් 2016.03.31 දිනට උපුටා ගත් ශේෂ පිරික්සුම පහතාකාර වේ.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| බැංකු පොලිය | 23 500 | |
| ප්‍රාග්ධන ගිණුම | | 4 230 000 |
| බැංකු ශේෂය | | 78 500 |
| පරිගණක | 54 500 | |
| විකුණුම් පිරිවැය | 4 455 000 | |
| දුන් වට්ටම් හා ලද වට්ටම් | 13 500 | 33 500 |
| වෑන් රථ බැහැර කිරීම් | | 1 200 000 |
| ගැනිලි | 455 000 | |
| විදුලිය | 45 500 | |
| ලද කොමිස් | | 34 500 |
| බැංකු ස්ථාවර තැන්පතු | 6 050 000 | |
| නිදහස් ඉඩම් | 2 100 000 | |
| ලී බඩු සහ උපකරණ | 123 500 | |
| රක්ෂණය | 34 500 | |
| ලද පොලී | | 665 500 |
| මෝටර් රථ අලුත්වැඩියා | 39 500 | |
| මෝටර් රථ | 2 233 500 | |

| | | |
|---|---|---|
| 2015.04.01 දිනට බොල් හා අඩමාන ණය වෙන්කිරීම. | | 12 300 |
| ක්ෂය සඳහා වෙන්කිරීම | | 1 234 500 |
| ගෙවල් කුලී | 198 000 | |
| ලද ගෙවල් කුලී | | 35 000 |
| වැටුප් හා වේතන | 567 800 | |
| විකුණුම් | | 50 750 000 |
| ආපසු එවුම් | 45 000 | |
| මුද්දර බදු හා නීති ගාස්තු | 181 700 | |
| 2015.03.31 දිනට තොගය | 678 000 | |
| දුරකථන | 345 000 | |
| ගෙවිය යුතු ගිණුම් | | 452 200 |
| ලැබිය යුතු ගිණුම් | 987 500 | |
| | 58 726 000 | 58 726 000 |

ඔබට පහත සඳහන් තොරතුරු සපයා ඇත.

1. අයිතිකරු තම පුද්ගලික පරිහරණයට ලබා ගත් භාණ්ඩ වල පිරිවැය රු. 23 500 ක් වේ.
2. රු. 4 000 ක ගැනුම් ඉන්වොයිසිය ගිණුම් පොත්වල සටහන් වී නොමැත.
3. රු. 1 000 ක ආපසු එවුම් අදාල ණයගැති ගිණුමේ පමණක් සටහන් වී නොමැත.
4. රු. 1 000 ක ලද වට්ටම් අදාල ලද වට්ටම් ගිණුමේ සටහන් වී නැත.
5. මුද්දර බදු සහ නීති ගාස්තු ගෙවනු ලැබ ඇත්තේ වර්ෂය තුලදී මිලදී ගත් නිදහස් ඉඩම් වෙනුවෙනි.
6. ව්‍යාපාරය කුලියට ලබාගත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර එහි මාසික කුලිය රු. 18 000කි. 2016 මාර්තු මස සඳහා වූ කුලිය ගෙවා නොතිබුණි.
7. ගොඩනැගිල්ලෙන් කොටසක් 2015 ඔක්තෝම්බර් මස 01 දින සිට සමාගම විසින් රු. 5 000ක මාසික කුලියට නැවත කුලියට දී ඇත.
8. 2015 04 01 දින ක්ෂය වෙන්කිරීම් වල සංයුතිය පහතාකාර වේ.

| | |
|---|---|
| මෝටර් වාහන | රු. 1200 000 |
| ලී බඩු හා උපකරණ | රු. 30 000 |
| පරිගණක | රු. 4 500 |

9. සමාගම විසින් දේපල පිරියත හා උපකරණ හීන වන ශේෂ ක්‍රමයට පහත දැක්වෙන ප්‍රතිශත මත ක්ෂය කරනු ලැබේ. මිලදී ගන්නා වසර සඳහා ක්ෂය කිරීම නොකරන අතර බැහැර කරන වර්ෂය සඳහා මුළු වර්ෂය වෙනුවෙන් ම ක්ෂය කරනු ලැබේ.

| | |
|---|---|
| මෝටර් වාහන | වර්ෂයකට 20% බැගින් |
| ලී බඩු හා උපකරණ | වර්ෂයකට 10% බැගින් |
| පරිගණක | වර්ෂයකට 20% බැගින් |

ඔබ විසින්,

01. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දල ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශය
02. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම
03. 2016.03.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

## VAT ගැලපුම (එකතු කල අගය මත බදු)

VAT යනු වක්‍ර බදු වලින් ප්‍රධානතම බදු වර්ගය වේ.

VAT සඳහා ව්‍යාපාර වර්ග 2 කි.

- ලියාපදිංචි වූ ව්‍යාපාර
- ලියාපදිංචි නොවූ ව්‍යාපාර

❖ ලියාපදිංචි වූ ව්‍යාපාරයක් නම්,

විකුණුම් මත VAT බදු එකතු කල යුතු අතර

ගැනුම් මත VAT බදු ගෙවයි.

මෙහිදී විකුණුම් මත එකතු කරගත් බදු වලින් ගැනුම් මත ගෙවූ බද්ද අඩු කොට ඉතිරිය දේශීය අදායම් දෙපාර්තුමේන්තුවට ගෙවයි.

❖ ලියාපදිංචි නොවූ ව්‍යාපාරයක් නම්,

ගැනුම් මත VAT බදු ගෙවනු ලබයි.

විකුණුම් මත VAT බදු එකතු කල යුතු නොවේ.

ගෙවන VAT වත්කමකි / යෙදවුම් බද්ද

ලැබෙන VAT වගකීමකි / නිමැවුම් බද්ද

**<u>බද්ද ගණනය කිරීම</u>**

බද්ද කොටස් දෙකයි.

- නිමවුම් බද්ද
- යෙදවුම් බද්ද

**<u>නිමැවුම් බද්ද</u>**

ව්‍යාපාරය භාණ්ඩ විකිණීමේදී හෝ සේවා සැපයීමේදී ගනුදෙනුකරුවන්ගෙන් එකතු කරගෙන රජයට ගෙවන බද්ද නිමැවුම් බද්ද වේ.

විකුණුම් (VAT සහිත) 000 ප්‍රතිශතය 12%

විකුණුම් (VAT රහිත) 300 000

ජර්නල් සටහන් දක්වන්න.

➢ සීමිත රුවන් සමාගම පහත ගණුදෙනු දී ඇත.

| | |
|---|---|
| අත්පිට විකුණුම් (VAT රහිත) | 400 000 |
| ණයට විකුණුම් (VAT සහිත) | 112 000 |
| සේවා අදායම් (VAT රහිත) | 250 000 |
| ආපසු යැවුම් (VAT සහිත) | 336 000 |

ප්‍රතිශතය 12%

- ජර්නල් සටහන්
- ලෙජර් ගිණුම්

**<u>යෙදවුම් බද්ද</u>**

ව්‍යාපාරය භාණ්ඩ මිලට ගැනීමේදී හෝ සේවා ලබාගැනීමේදී වියදම සමග ගෙවීමට සිදුවන බද්ද යෙදවුම් බද්ද වේ.

උදා: සීමිත සමාගම ගැනුම් පහත දැක්වේ. මෙහි VAT ඇතුලත්ව ඇත.

| | |
|---|---|
| අත්පිට ගැනුම් | 224,000 |
| ණයට ගැනුම් | 336,000 |
| වියදම් | 44,800 |
| ආපසු යැවුම් | 44,800 |
| VAT ප්‍රතිශතය | 12% |

- ජර්නල් සටහන්
- ලෙජර් ගිණුම

සැයු:- අප විසින් දරන සෑම වියදමකම VAT නොමැත.

පහත වියදම් වල VAT නොමැත.

- විදුලි ගාස්තු
- වැටුප් හා වේතන
- බෝල් ණය
- ක්ෂය වීම්.
- ලියාපදිංචි නොවූ තැනැත්තන්ගෙන් මිලට ගැනීමේදී VAT ගෙවීමට සිදු නොවේ.

❖ රුවන් ආරම්භ කරන ලද ව්‍යාපාරයේ 2016.03.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ. (මෙම ව්‍යාපාරය 2015.01.01 දින සිට VAT සඳහා ලියාපදිංචි වූ ආයතනයකි)

| | හර රු. | බැර රු. |
|---|---|---|
| ප්‍රාග්ධන | | 890,000 |
| විකුණුම් පිරිවැය | 400,000 | |
| දේ.පි. හා උපකරණ | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 600,000 | |
| යන්ත්‍ර උපකරණ | 480,000 | |
| 2016.03.31 තොගය | 5,000 | |
| විගණන ගාස්තු | 2,000 | |

| | | |
|---|---|---|
| ප්‍රචාරණය | 7,840 | |
| විදුලි ගාස්තු | 3,000 | |
| දුරකථන ගාස්තු | 56,000 | |
| දේ.පි. හා උපකරණ (ක්ෂය වෙන්කිරීම්) 2015.04.01 දිනට | | |
| ඉඩම් හා ගොඩනැගිලි | | 60,000 |
| යන්ත්‍ර උපකරණ | | 80,000 |
| විකුණුම් | | 896,000 |
| ආපසු එවුම් | 2,800 | |
| 2015.07.01 මිල දී ගත් යන්ත්‍ර උපකරණයේ වටිනාකම (12% ඇතුලුව) | 100,800 | |
| ණයගැති පාලන ගිණුම | 60,000 | |
| ණයහිමි පාලන ගිණුම | | 30,000 |
| බැංකු ගාස්තු | 300 | |
| VAT පාලන ගිණුම | 20,000 | |
| ගැතිලි | 4,000 | |
| 2015.04.01 දිනට අඩමාන ණය වෙන්කිරීම | | 4,000 |
| මුදල් හා බැංකු ශේෂය | 268,660 | |
| | 1,960,000 | 1,960,000 |

අතිරේක තොරතුරු

1. විකුණුම් පිරිවැය තුල අඩංගු ගැනුම් හා ආපසු යැවුම් හි වටිනාකම 12% VAT ඇතුළුව පිලිවෙලින් රු. 244,000 හා රු. 33,600 කි.
2. ආපසු යැවුම් හා එවුම් හි අඩංගු VAT ප්‍රතිශතය 12% කි.
3. පහත සඳහන් වියදම් හි 12% VAT ඇතුලත් ය.
   ප්‍රචාරණය
   දුරකථන ගාස්තු
4. විගණන ගාස්තු වලට අදාල 12% මුදල ව්‍යාපාරය මෙතෙක් ගලපා නොමැත.
5. 2016.01.01 දින පීරිස් සමූහ ව්‍යාපාරයෙන් ලබාගන්නා ලද යන්ත්‍ර උපකරණ හි 12% VAT ඇතුළු මිල රු. 56,000 ක් වන අතර එම ගනුදෙනුව සම්බන්ධව කිසිදු තොරතුරක් අප පොත්වල වාර්තා වී නොමැත.
6. ව්‍යාපාරයේ ක්ෂය ප්‍රතිපත්තිය මෙසේය.

   ඉඩම් හා ගොඩනැගිලි 12%

   යන්ත්‍ර උපකරණ 6%

7. ව්‍යාපාරය අඩමාන ණය 5% බැගින් වාර්ෂිකව වෙන්කිරීම සිදුකරනු ලබයි.

ඔබ විසින්

01. VAT පාලන ගිණුම

02. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම

03. 2016.03.31 දිනට ශේෂ පත්‍රය

❖ චතුර සමාගමේ 2016 මාර්තු 31 දිනට පොත්වලින් උපුටාගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| ඉඩම් (පිරිවැය) | 300,000 | |
| ගොඩනැගිලි (පිරිවැය) | 250,000 | |
| ලී බඩු හා සවිකිරීම් (පිරිවැය) | 100,000 | |
| මෝටර් රථ (පිරිවැය) | 400,000 | |
| 2015.04.01 ක්ෂය වෙන්කිරීම් | | |
| ගොඩනැගිලි | | 40,000 |
| ලී බඩු හා සවිකිරීම් | | 20,000 |
| මෝටර් රථ | | 100,000 |
| 12% ආයෝජන | 100,000 | |
| ආයෝජන අදායම් | | 8,000 |
| 20% බැංකු ණය | | 150,000 |
| බැංකු ණය පොලී | 20,000 | |
| ණයගැතියෝ සහ ණයහිමියෝ | 80,000 | 60,000 |
| 2015.04.01 අඩමාන ණය වෙන්කිරීම | | 2,000 |
| 2015.04.01 බඩු තොගය | 60,000 | |
| බැංකු ශේෂය | 30,000 | |
| අතැති මුදල් | | 10,000 |
| ගැනුම් සහ විකුණුම් (VAT සහිතව) | 550,000 | 880,000 |
| ආපසු එවුම් සහ ආපසු යැවුම් (VAT සහිතව) | 33,000 | 55,000 |
| VAT ගිණුම 2014.04.01 | | 10,000 |
| ගෙන ඒමේ කුලී | 30,000 | |
| සේවක ඇප | | 40,000 |
| දුන් වට්ටම් සහ ලද වට්ටම් | 10,000 | 15,000 |
| විවිධ අදායම් | | 40,000 |
| කඩ කුලී | 33,000 | |

| | | |
|---|---|---|
| රක්ෂණය | 17,000 | |
| වරිපනම් | 6,000 | |
| විදුලිය | 18,000 | |
| වැටුප් හා වේතන | 36,000 | |
| ප්‍රචාරණය | 18,000 | |
| ඇසුරුම් වියදම් | 12,000 | |
| සේවක ණය | 60,000 | |
| පැටවුම් කුලී | 5,000 | |
| ගෙවිය යුතු බිල් | | 20,000 |
| ගැනිලි | 40,000 | |
| ප්‍රාග්ධනය | | 758,000 |
| | 2,208,000 | 2,208,000 |

**පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා තිබේ.**

1. 2016 මාර්තු 31 දිනට තොගයේ පිරිවැය රු. 80,000 කි. මෙහි ශුද්ධ උපලබ්ධි අගය රු. 75,000කි.
2. VAT අනුපාතය 10% ක් වන අතර මේ සම්බන්ධව කිසිම ගැලපීමක් කර නොමැත.
3. මුදල් නැතිවීම් රු. 8,000 කි.මෙයින් රු. 5,000 ක් සේවක ඇප වලින් හිලව් කරගැනීමට එකඟ වී තිබේ.
4. රථ සරල මාර්ග ක්‍රමයට 10% ක් ද ගොඩනැගිලි පිරිවැය මත 8% ක් ද ලී බඩු සරල මාර්ග ක්‍රමයට 5% ක් ද ක්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කෙරේ.
5. අඩමාන ණය වෙන්කිරීම ණයගැතියන්ගෙන් 5% කි.

අවශ්‍ය වන්නේ,

1) 2016.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අදායම් ප්‍රකාශනය
2) 2016.03.31 දිනට ශේෂ පත්‍රය